**09-02-2026** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, දුප්පතුන්ගේ අධිපති වන බාබා, ඔබව කටු වලින් දියමන්ති බවට පත් කිරීමට පැමිණ ඇත. එබැවින් නිරන්තරයෙන්ම ඔහුගේ ශ්‍රීමත් අනුගමනය කරන්න.

**ප්‍රශ්නය:** ඔබ, සෑම දෙනාටම පළමුවෙන්ම විස්තර කර දිය යුත්තේ කුමන රහසද?

**පිළිතුර:** බාප් සහ දාදා ගේ රහස. ඔබ මෙහි පැමිණ ඇත්තේ බාප්දාදා වෙතට බව ඔබ දන්නවා. දෙදෙනාම ඇත්තේ එකටයි. ශිවාගේ ජීවාත්මය මෙම කෙනා තුළ සිටින අතර බ්‍රහ්මාගේ ජීවාත්මය ද ඇත. එකක් ජීවාත්මයක් වන අතර අනෙක උත්තරීතර ජීවාත්මයයි. පළමුවෙන්ම, මෙහි බාප් සහ දාදා එකට සිටිනවාය යන ගැඹුරු රහස සැමටම විස්තර කර දෙන්න. මෙම දාදා දෙවියන් නොවෙයි. මනුෂ්‍යයෙකුට දෙවියන් විය නොහැක. පරමාත්ම දෙවියන් යැයි කිව හැක්කේ අශාරීරික ඒකායන කෙනාට පමණයි. ඔහු පරමාත්ම පියායි. ඔහු සාම දේශයේ වාසය කරන්නාය.

**ගීතය:** අප මහ බලා සිටි දිනය අවසානයේදි පැමිණ ඇත!

ඕම් ශාන්ති. පරම පියා, දාදා තුළින් උගන්වන බව, එනම් ශිව් බාබා, බ්‍රහ්මා දාදාගේ මාර්ගයෙන් විස්තර කරන බව ස්ථිර කර ගන්න. ලෞකික සම්බන්ධකමකදී පියා සහ සීයා වෙන වෙනම හිඳියි. ඔබ සීයාගේ උරුමය, පියාගේ මාර්ගයෙන් ලබා ගනී. ඔබ ඔබගේ සීයාගේ උරුමය හිමි කර ගන්නා බව කියැවේ. ඔහු දුප්පතුන්ට අධිපතිය. දුප්පතුන්ව කිරුළු පළන් අය බවට පත් කිරීමට පැමිණෙන කෙනා දුප්පතුන්ගේ අධිපතියායි. එබැවින් පළමුවෙන්ම මෙම කෙනා කවුරුන්ද කියන ස්ථිර විශ්වාසය තිබිය යුතුයි. බලද්දී, ඔහු නිකම් මනුෂ්‍යයෙකි. ඔබ සැවොම ඔහුට බ්‍රහ්මා යැයි කියයි. ඔබ සැවොම බ්‍රහ්ම කුමර කුමරියන්ය. ඔබ ශිව් බාබාගෙන් උරුමයක් හිමි කර ගන්නා බව ඔබ දනී. සෑම දෙනාගේම පරම පියා, උරුමය ලබා දීමට පැමිණ සිටියි. පියා, සතුටේ උරුමය ලබා දෙන අතර, ඉන්පසු, චක්‍ර භාගයකට පසුව, රාවණ් දුකෙහි සාපය ලබා දෙයි. භක්ති මාර්ගයේ මිනිසුන් දෙවියන් සොයමින් සෑම තැනම රස්තියාදු වන නමුත් කිසිවෙකුට ඔහුව සොයා ගත නොහැක. ඔබ මවත් පියාත් වන අතර අපි ඔබගේ පිහිටෙන් බොහෝ සතුට ලබා ගනී යැයි භාරතයේ ජනයා ගායනා කරයි. ඉන්පසු ඔවුන් මෙසේද කියයි ඔබ පැමිණි විට, අප ඔබට මිස අන් කිසිවෙකුට අයත් වන්නේ නැත. අන් කිසිවෙකුට අපි බැඳීමක් ඇති කර ගන්නේ නැත. එක් ශිව් බාබා පමණක් මගේය! පරමාත්ම පියා දුප්පතුන්ට අධිපති බව ඔබ දන්නවා. දුප්පතුන්ව ධනවත් කරවන්නේ, කටු වැනි අයව දියමන්ති බවට පත් කරවන්නේ ඔහුය, එනම්, පරම පියා පැමිණ ඇත්තේ අපවිත්‍ර, කලි යුගී, දුප්පතුන්ව, කිරුළු පළන්, ස්වර්ණමය යුගී අය බවට පත් කරවීමටයි. ඔබ මෙහි බාප්දාදා වෙතට පැමිණ ඇති බව ඔය දරුවන්ට වැටහෙයි. දෙදෙනා එකට ඇත. ශිවාගේ ජීවාත්මය මොහු තුළ ඇති අතර, බ්‍රහ්මාගේ ජීවාත්මයද මොහු තුළ ඇත, එබැවින් ඔවුන් දෙදෙනෙක් සිටියි. එක්කෙනෙක් ජීවාත්මයක් වන අතර අනෙක් කෙනා උත්තරීතර ජීවාත්මයයි. ඔබ සෑම දෙනාම ජීවාත්මයන්ය. ජීවාත්මයන්, බොහෝ කාලයක් උත්තරීතර ජීවාත්මයෙන් වෙන් වී සිටි බව සිහිපත් කෙරේ. ඔය ජීවාත්මයන්ට ඔහුව පළමුවෙන් මුණ ගැසෙයි, එනම් ජීවාත්මයන්ට, ඔවුන් අහෝ දෙවි පියාණනි, යැයි අඬගසන පියාව, උත්තරීතර ජීවාත්මය, මුණ ගැසෙයි. ඔබ ඔහුගේ දරුවන්ය. ඔබට අනිවාර්යෙන්ම පියාගෙන් උරුමයක් ලැබෙයි. පියා පවසන්නේ කිරුළ වූ භාරතය, දැන් බොහෝ දුප්පත් වී ඇත! ඔය දරුවන්ට කිරුළු පැළඳවීමට මම නැවත වරක් පැමිණ සිටින්නෙමි. ඔබ ද්විත්ව කිරුළු පළන් අය බවට පත්වෙයි. එකක්, ආලෝකයෙන් පෙන්නුම් කරන, පාරිශුද්ධත්වයේ කිරුළයි. අනෙක මැණික් කිරුළයි. එබැවින් බාප් සහ දාදා එකට සිටින බව, යන ගැඹුරු රහස සැමටම විස්තර කර දෙන්න. මෙම කෙනා දෙවියන් නොවෙයි. මනුෂ්‍යයෙකුට දෙවියන් විය නොහැක. අශාරීරික කෙනාට පරමාත්ම දෙවියන් යැයි කියයි. ජීවාත්මයන් වන ඔබ සැවොමත් වාසය කරන, සාම දේශයේ, වාසය කරන ඔහු, පරමාත්ම පියාය. එයට ශබ්දයෙන් එහා දේශය (නිර්වාණය) සහ විශ්‍රාමික දේශය යැයිද කියයි. ඉන්පසු ඔය ජීවාත්මයන් ඔබගේ චරිත කොටස් රඟපෑම සඳහා ශරීර ලබා ගත යුතු වෙයි. චක්‍රයෙන් භාගයක සතුටෙහි කොටස ඇති අතර, චක්‍රයෙන් භාගයක දුකෙහි කොටස ඇත. පරම පියා පවසන්නේ මම පැමිණෙන්නේ දුකෙහි අවසානය වන විටයි. මෙම නාටකය පෙර නියමිත වූ එකකි. බාබා නාටකය පිළිබඳව මුරලියේ හොඳින් විස්තර කර ඇත. ඔය දරුවන් එම මුරලිය පාඩම් කළ යුතුයි. ඔබ මෙහි පැමිණෙන්නේ බත්තියක් තුළටයි. මෙහිදී, ඔබ බාහිර ලෝකය පිළිබඳ කිසිවක් සිහිපත් නොකළ යුතුයි. මෙහි

සිටින්නේ මව, පියා සහ දරුවන්ය. ශුද්‍රයින්ගේ ජන කොටසට අයත් කිසිවෙකු මෙහි නොමැත. බ්‍රහ්මීණ් නොවන අයට ශුද්‍රයින් යැයි කියයි. ඔබට මෙහිදී ඔවුන්ගේ ආශ්‍රය නොමැත. මෙහිදී බ්‍රහ්මීණ්වරුන්ගේ ආශ්‍රය පමණක් ඔබට තිබේ. ශිව් බාබා පැමිණ සිටින්නේ ඔබව අපායෙන් රැගෙන ගොස්, බ්‍රහ්මාගේ මාර්ගයෙන් දෙව්ලොව රාජධානියට අධිපතියන් බවට පත් කිරීමට බව ඔය බ්‍රහ්මීණ් දරුවන් දනී. මේ කාලයේ අපි අපවිත්‍ර බැවින්, අධිපතියන් නොවේ. අපි පාරිශුද්ධව සිටි අතර ඉන්පසු අපි උපත් 84 හි චක්‍රය වටා ගියේය. අපි සතෝ, රජෝ සහ තමෝ තත්ත්වයන් තුළින් ගියේය. උපත් 84 හි ගිණුම පිළිබඳව ඉනිමග පිංතූරයේ ලියා ඇත. පරම පියා මෙතැන අසුන් ගෙන ඔය දරුවන්ට විස්තර කරයි. ඔහු පළමුවෙන් මුණ ගැසෙන දරුවන්, පළමුව ස්වර්ණමය යුගයට යයි. ඔබ උපත් 84 ක් ගෙන ඇත. නිර්මාණකරු සහ නිර්මාණය පිළිබඳ සියලුම ඥානය ඇත්තේ එක් පරම පියාට පමණයි. ඔහු කල්ප වෘක්ෂයේ බීජයයි. මෙම වෘක්ෂය වැඩෙන අන්දම, රැකෙන අන්දම සහ විනාශ වන අන්දම පිළිබඳ ඥානය අනිවාර්යෙන්ම බීජය තුළ ඇත. පරම පියා පමණයි මෙය විස්තර කරන්නේ. භාරත ජනතාව වන ඔබ දූප්පත් බව ඔබ දනී. ඔබ දේවතාවරුන්ව සිටි විට, ඔබ බොහෝ ධනවත් වීය. ඔබ සෙල්ලම් කළේ දියමන්ති සමඟයි. ඔබ ජීවත් වූයේ දියමන්ති එබ්බවූ මාලිගාවලයි. ඔබ උපත් 84 ක් ගන්නා අන්දම පිළිබඳව පියා ඔබට දැන් සිහිපත් කරයි. ඔහෝ පාරිශුද්ධත්වයට පමුණුවන්නා! බාබා, දූප්පතුන්ගේ අධිපති, පැමිණෙන්න! යැයි ඔබ අඬගැසුවේය. දූප්පත් අපව නැවත වරක් දෙව්ලොවට අධිපතියන් බවට පත් කරන්න. ස්වර්ණමය යුගයේ බොහෝ සතුට තිබුණු අතර දැන් බොහෝ දුක තිබේ. මේ කාලයේ සියලුම දෙනා සම්පූර්ණයෙන්ම අපවිත්‍ර වී ඇති බව ඔය දරුවන් දනී. එය දැන් කලි යුගයේ අවසානය වන අතර, ස්වර්ණමය යුගය තිබිය යුතුයි. මුලදී භාරතයේ තිබුණේ ආදි සනාතන දේවී දේවතා ධර්මය පමණයි. එය දැන් අතුරුදහන් වී ඇත. අන් සියලු දෙනා තමන්ට හින්දූන් යැයි කියා ගනී. මේ කාලයේදී ක්‍රිස්තියානිවරුන් බොහෝ දෙනෙක් සිටියි, මන්ද හින්දු ආගමේ බොහෝ දෙනෙක් එම ආගමට ගොස් ඇති නිසා. ආදි කාලයේද, ඔය දේවතාවන්ගේ ක්‍රියාවන් උසස් වීය. ඔබ අයත් වූයේ පාරිශුද්ධ පවුල් මාවතටයි. දැන් රාවණ්ගේ රාජධානියේදී, ඔබ අපවිත්‍ර පවුල් මාවතට අයත් අය බවට පත් වී තිබේ, ඒ නිසයි ඔබ දුක් විඳින්නේ. ස්වර්ණමය යුගයට ශිවාගේ දේවාලය (ශිවාලය) යැයි කියයි. දිව්‍ය ලෝකය ස්ථාපනය කරන්නේ ශිව් බාබායි. පරම පියා පවසන්නේ මම පැමිණෙන්නේ ඔය දරුවන්ව ශුද්‍රයින්ගෙන් බ්‍රහ්මීණ්වරුන් බවට පරිවර්ථනය කර, ඔබට ඔබගේ සූර්ය සහ චන්ද්‍ර වංශික රාජධානි වල උරුමය ලබා දීමටයි. මේ බාප්දාදායි. ඔවුන්ව අමතක නොකරන්න. බ්‍රහ්මාගේ මාර්ගයෙන්, ශිව් බාබා ඔබව දෙව්ලොව යෑමට තරම් වටිනා අය බවට පත් කරවමින් සිටියි, මන්ද ඔවුන් පාරිශුද්ධ වන තුරු, අපවිත්‍ර ජීවාත්මයන්ට විමුක්ති දේශයට යා නොහැකි නිසා. පරම පියා පවසන්නේ ඔබට පාරිශුද්ධ වන අන්දම පෙන්වීමට මම දැන් පැමිණ සිටින්නෙමි. ඔබව කෝටිපතියන්, දෙව්ලොවට අධිපතියන් බවට පත් කිරීමෙන් අනතුරුව මම පිටත්ව ගියෙමි. ඔබ ඇත්ත වශයෙන්ම දෙව්ලොවට අධිපතියන්ව සිටි බව ඔබට සිහි වී ඇත. ඒ කාලයේ සිටියේ අප ටික දෙනෙක් පමණයි. දැන් බොහෝ මනුෂ්‍යයින් සිටිති. ස්වර්ණමය යුගයේ ඇත්තේ 900,000 යි. පරම පියා පවසන්නේ මම පැමිණ බ්‍රහ්මාගේ මාර්ගයෙන් දෙව්ලොව ස්ථාපනය කර, ශංකර් තුළින් විනාශය සිදු කරන්නෙමි. පෙර චක්‍රයේදී කළ අයුරින්ම, සියලු දෙනාම සෑම සූදානමක්ම සිදු කරමින් සිටිති. ඔවුන් ඒ තරම් විශාල ප්‍රමාණයකින් බෝම්බ නිපදවයි. වසර 5000 කට පෙර ද මහාභාරත යුද්ධය සිදු විය. පරමාත්ම දෙවියන් පැමිණ රාජයෝගා උගන්වා සාමාන්‍ය මිනිසුන් නාරායන බවට පරිවර්ථනය කළේය. එබැවින් අපවිත්‍ර කලි යුග ලෝකය අනිවාර්යෙන්ම විනාශ විය යුතුයි. පිදුරු ගොඩට ගිණි තැබිය යුතුය. එසේ නොමැති නම් විනාශය සිදු වන්නේ කෙසේද? මේ දිනවල වහා ගිනි අවුලුවන බෝම්බද තිබේ. මුරුගසන් වරුසා සහ භූමි කම්පා ද ඇති වෙයි, මන්ද එවිට පමණයි විනාශය සිදු විය හැකි වන්නේ. පැරණි ලොවෙහි විනාශය සහ නව ලොවෙහි ස්ථාපනය සිදු විය යුතුයි. මෙය සංගම් යුගයයි. රාවණ්ගේ රාජධානියට මරණයද, රාමාගේ රාජධානියට ජයග්‍රහණයද ඇති වෙයි. නව ලොවෙහි ක්‍රිෂ්ණාගේ රාජධානිය තිබිණි. ලක්ෂ්මි සහ නාරායන් ගේ නම් වෙනුවට, ඔවුන් ක්‍රිෂ්ණාගේ නම සඳහන් කරයි, මන්ද ක්‍රිෂ්ණා ලස්සන සහ ඉතාමත් ආදරණීය දරුවෙක් නිසා. මිනිසුන් මෙය නොදනී. ක්‍රිෂ්ණා සහ රාධෙ පැමිණියේ වෙන් වෙන් රාජධානි වලිනි. භාරතය කිරුළ පැළඳ සිටි නමුත්, දැන් එය බංකොලොත්භාවයට පත් වී ඇත. එයට නැවත වරක් කිරුළ පැළඳවීමටයි පරමාත්ම පියා පැමිණෙන්නේ. පියා පවසන්නේ දැන් පාරිශුද්ධ වී නිරන්තරයෙන් මා පමණක් සිහිපත් කරන්න, එවිට ඔබ සතෝප්‍රධාන් වෙයි. සේවය කරන සහ අන් අයවත් තමා හා සමාන කරවන අය, උසස් තත්ත්වයකට හිමිකම් කියන අතර, ද්විත්ව කිරුළු පළන් අය බවට පත් වෙයි. ස්වර්ණමය යුගයේ, රජ, රැජින සහ වැසියන් යන සියල්ලන්ම පාරිශුද්ධයි. දැන් එය ජනතාව විසින් පාලනය කරන රජයකි. එකදු කිරුළක්වත් දැන් නොමැත. පරම පියා පවසන්නේ මම පැමිණෙන්නේ ලෝකයේ තත්ත්වය මෙය වූ විටයි. මම දැන් ඔය දරුවන්ට රාජ යෝගා උගන්වන්නෙමි.

පාරිශුද්ධත්වයට පමුණුවන්නා මා පමණයි. දැන් මා සිහිපත් කරන්න එවිට ඔය ජීවයන්ගේ අපද්‍රව්‍ය ඉවත් වෙයි. එවිට ඔබ සතෝප්‍රධාන් වෙයි. ඔබ දැන් අවලස්සන (ශ්‍යාම්) සිට ලස්සන (සුන්දර්) බවට පරිවර්ථනය විය යුතුයි. රත්තරං වලට ලෝහ මිශ්‍ර වූ විට එය අව පැහැ ගැන්වෙයි. එබැවින් දැන් ලෝහ ඉවත් කළ යුතුයි. අසීමිත පියා පවසන්නේ ඔබ රාගයේ ගිනි කොත මත අසුන් ගැනීමෙන් අවලස්සන වී ඇත! දැන් ඥානයේ ගිනි කොත මත අසුන් ගෙන සියල්ලන්ටම ඇති බැඳීම් ඉවත් කර ගන්න. ඔබ එකම ආදරවන්තයා වන මාගේ, ආදරවන්තයින්ය. සියලුම භක්තිකයින් දෙවියන් සිහිපත් කරයි. ස්වර්ණමය සහ රිදීමය යුගයන්හිදි භක්තිය නොමැත. එහිදි ඇත්තේ ඥානයේ ඵලයයි. පරම පියා පැමිණ, ඥානය තුළින් රාත්‍රිය, දහවල බවට පරිවර්ථනය කරයි. ඔබ ආගමික පොත පත හැදැරීමෙන් දහවල ඇති වන්නේ නැත. ඒ සැම දෙයක්ම භක්ති මාර්ගයේ ද්වල්ය. එක් පියා පමණයි ඥාන සාගරය, පාරිශුද්ධත්වයට පමුණුවන්නා වන්නේ. ඔහු පැමිණ ඔය දරුවන්ට යෝගා සහ ලෝක චක්‍රය පිළිබඳ ඥානය උගන්වයි. ඊශ්වර් (දෙවියන්) සමඟ යෝගා ඇති අය, යෝගේශ්වර් (පරමාත්ම දෙවියන් සමඟ යෝගා ඇති අය) වෙයි, ඉන්පසු රජ කුමර කුමරියන් වෙයි. පරමාත්ම පියා විසින් ඔබව රජවරුන්ගේ රජවරුන් බවට පත් කරවනු ලබයි. පාරිශුද්ධ රජවරුන් වූ අය ඉන්පසු අපවිත්‍ර විය. වැඳුම් ලබන්නට සුදුස්සන් ව සිටි ඔබ, ඉන්පසු වඳින්නන් බවට පත් වූයේය. දැන් ආදරවන්තියක් තම ආදරවන්තයාව සිහිපත් කරන අන්දමට, විවාහ ගිවිසුම් ගත් ජෝඩුවක් නොකඩවා එකිනෙකාව සිහිපත් කරන අන්දමට හැකි පමණින් සිහිපත් කිරීමේ වන්දනාවේ යෙදෙන්න. එම ආදරවන්තයාට භක්ති මාර්ගයේ ආදරවන්තයින් බොහෝ දෙනෙක් ඇත. සියලුම දෙනා දුක ඇති විට පියා සිහිපත් කරයි. අහෝ දෙවියනි! අපගේ දුක නැති කර සතුට ලබා දෙන්න! මෙහි සාමය හෝ සතුට නොමැත. ඒ දෙකම ස්වර්ණමය යුගයේ පවතී. උපත් 84කට ඔබගේ චරිත කොටස් රඟ පාන්නේ කෙසේද කියා ඔය ජීවාත්මයන් දැන් දන්නවා. ඔබ බ්‍රහ්මීණ්වරුන්, දේවතාවන්, ක්ෂත්‍රීයන්, වෙළෙන්දුන් සහ ශුද්‍රයින් වෙයි. උපත් 84 හි ඉනිමඟ ඔබගේ බුද්ධියේ ඇත. ඔබගේ පාපයන් කපා දැමීමට දැන් හැකි පමණින් පරමාත්ම පියා සිහිපත් කරන්න. ක්‍රියාවන් කරන අතරතුරදි පියාගේ සිහිපත් කිරීම ඔබගේ බුද්ධියේ තබා ගන්න. බාබාගෙන් අපි අපගේ දිව්‍ය ලෝකයේ උරුමය හිමි කර ගනිමින් සිටින්නෙමු. පියා සහ ඔබගේ උරුමය සිහිපත් කරන්න. සිහිපත් කිරීමෙන් පමණයි ඔබගේ පාපයන් දුරු වන්නේ. ඔබ වැඩියෙන් සිහිපත් කිරීමේ සිටින තරමට පාරිශුද්ධත්වයේ ආලෝකය වැඩියෙන් තිබෙයි. අපවිත්‍ර ලෝහ නොකඩවා ඉවත් වෙයි. හැකි තරම් සිහිපත් කිරීමේ සිටිනා ක්‍රම ඇති කර ගැනීමට ඔය දරුවන් කාලය සොයාගත යුතුයි. උදේට ඔබට බොහෝ වේලා තිබේ. මෙම උත්සාහය දරන්න. ඔබ නිවසේ හිඳ ඔබගේ දරුවන් බලා ගත්තාට කම් නැත, එහෙත් මෙම අවසන් උපතේ ඔබ පාරිශුද්ධව සිටිය යුතුයි. රාගයේ ගිනි කොත මතට නඟින්න එපා. ඔබ දැන් ඥානයේ ගිනි කොත මත අසුන් ගෙන සිටියි. මෙම ඉගෙනුම ඉතාමත් ශ්‍රේෂ්ඨයි. එයට රත්තරං භාජනයක් අවශ්‍යයි. පරම පියා සිහිපත් කිරීමෙන් ඔබ රත්තරං භාජනයක් මෙන් වෙයි. සිහිපත් කිරීමේ සිටින්නට ඔබ අමතක කළ විට ඔබ යකඩ භාජනයක් වෙයි. පරම පියා සිහිපත් කිරීමෙන් ඔබ දෙව්ලොවට අධිපතියන් වෙයි. මෙය ඉතාමත් පහසුයි. මෙහි ප්‍රධානතම දේ පාරිශුද්ධත්වයයි. ඔබ පාරිශුද්ධත්වයට පත් වන්නේ සිහිපත් කිරීමෙන් පමණයි, තවද ලෝක චක්‍රය සිහිපත් කිරීමෙන් ඔබ දෙව්ලොවට අධිපතියන් වෙයි. ඔබ නිවෙස අතහැර යෑම ආදිය කළ යුතු නැත. තම පවුල සමඟ ඔබට නිවසේ විසිය හැක. පරම පියා පවසන්නේ ඔබ උපත් 63 ක් අපවිත්‍ර ලෝකයේ ජීවත් වී ඇත. එබැවින් ශිවාගේ දෙවොලට, අමරණීය දේශයට යෑම සඳහා, මෙම එක උපතේදී ඔබ පාරිශුද්ධ වූවාට කම් නැහැ නේද? ඔබ විශාල ආදායමක් උපයා ගනී. දුර්ගුණ පහ ජය ගන්න, එවිට පමණයි ඔබට ලොව ජය ගත හැකි වන්නේ. නැත්නම් ඔබට තත්ත්වයක් හිමි කර ගැනීමට නොහැකි වෙයි. පරම පියා පවසන්නේ සැම කෙනෙක්ම මරණයට පත් විය යුතුයි. මෙය ඔබගේ අවසන් උපතයි. ඉන්පසු ඔබ ගොස් නව ලෝකය පාලනය කරයි. දියමන්ති සහ මැණික් ආකර පිරෙයි. එහි ඔබ දියමන්ති සහ මැණික් සමඟ සෙල්ලම් කරයි. ඔබ එවැනි පියෙකුට අයත් වී ඔහුගේ උපදෙස් ද පිළිපැදිය යුතුයි. ශ්‍රීමත් අනුගමනය කිරීමෙන් පමණයි ඔබ ශ්‍රේෂ්ඨත්වයට පත් වන්නේ. රාවණ්ගේ උපදෙස් පිළිපැදීමෙන් ඔබ දූෂිත වී ඇත. දැන් පරම පියාගේ ශ්‍රීමත් අනුගමනය කර තමෝප්‍රධාන් සිට සතෝප්‍රධාන් වන්න. පියා සිහිපත් කරන්න! පියා ඔබට වෙන අපහසුතාවයක් දෙන්නේ නැත. ඔබ භක්ති මාර්ගයේ බොහෝ සේ රස්තියාදු විය. දැන් පරම පියාව සහ ලෝක චක්‍රය පමණක් සිහිපත් කරන්න. ස්වදර්ශන් චක්‍රධාරීන් වන්න, එවිට ඔබ උපත් 21කට ලෝක පාලකයන් බවට පත් වෙයි. ඔබ බොහෝ වාර ගණනක් රාජධානිය හිමි කර ගෙන එය නැති කරගෙන ඇත. චක්‍රයෙන් භාගයක් සතුට තිබෙන අතර චක්‍රයෙන් භාගයක් දුක තිබෙයි. පරම පියා පවසන්නේ මම සැම චක්‍රයකම සංගම් යුගයේදි පැමිණෙන්නෙමි. මම ඔබව සතුටු දේශයේ අධිපතියන් බවට පත් කරවන්නෙමි. ඔබ චක්‍රය වටා යන්නේ කෙසේද, යන අවධානය ඔබට දැන් තිබේ. මෙම චක්‍රය ඔබගේ බුද්ධියෙහි තබා ගන්න. පරම පියා ඥානයේ

සාගරයයි. ඔබ මෙතැන අසුන් ගෙන සිටින්නේ අසීමිත පියා ඉදිරියේය. උසස්ම උසස් පරමාත්ම දෙවියන්, ප්‍රජාපිතා බ්‍රහ්මාගේ මාර්ගයෙන් ඔබට, ඔබගේ උරුමය ලබා දෙමින් සිටියි. එබැවින් දැන්, විනාශය සිදු වන්නට පෙර, පරම පියා සිහිපත් කොට පාරිශුද්ධත්වයට පත් වන්න. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. නිරතුරුවම පරමාත්ම පියාගේ සිහිපත් කිරීමේ සිටීම සඳහා, ඔබගේ බුද්ධිය රත්තරං භාජනයක් බවට පත් කරන්න. ක්‍රියාවන් සිදු කරන අතරතුරදී ද පියාගේ සිහිපත් කිරීම තිබිය යුතුයි. සිහිපත් කිරීමේ සිටීමෙන් පමණයි පාරිශුද්ධත්වයේ ආලෝකය ඇති වන්නේ.
2. කිසිම විටෙක මුරලියක් අතපසු නොකරන්න! නාටකයේ රහස නිවැරදිව වටහා ගන්න. මෙම බත්තියේ සිටින විට, ඔබ බාහිර ලෝකයේ කිසිවක් සිහිපත් නොකළ යුතුයි.

**වරදානය:** ඔබ එකිනෙකාගේ විශේෂතා පමණක් දකින සහ කතා කරන උසස් ශුද්ධ හංසයෙකු වේවා. සංගම් යුගයේ දී, සෑම දරුවෙකුටම මෙම ඥානය හරහා කුමන හෝ ගුණධර්මයක් නිසැකවම ලැබී ඇත. එබැවින්, ශුද්ධ හංසයෙකු වී එක් එක් අයගේ විශේෂතා පමණක් දකින්න, කතා කරන්න. ඔබ අන් අයගේ අඩුපාඩු දෙස බලන විට හෝ ඒවාට සවන් දෙන විට, එය ඔවුන්ගේ අඩුපාඩු නොව ඔබේම බව ඔබ තේරුම් ගත යුතුය, මන්ද ඔබ සියලු දෙනාම එකම එක පියාට සහ එකම එක පවුලට අයත් වන අතර එකම එක ජපමාලයේ පබළු වේ. ඔබේ දුර්වලතා අන් අයට දැන ගැනීමට ඔබ ඉඩ නොතබන ආකාරයටම, ඒ ආකාරයෙන්ම, අන් අයගේ දුර්වලතා ගැන ද කතා නොකරන්න. ශුද්ධ හංසයා යනු විශේෂතා ලබාගෙන දුර්වලතා අවසන් කරන අයෙකි.

**පාඨය:** කාලය ඉතිරි කරන දැඩි උත්සාහවන්තයා සැමවිටම ජයග්‍රාහී වේ.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: එකමුතුකම සහ විශ්වාසයේ විශේෂත්වයෙන් සාර්ථකත්වයෙන් පිරිපුන් වන්න..**

පබළු වල විශේෂත්වය නම්, එකම වර්ගයේ පබළු සියල්ලම එක නූලක අමුණා තිබීමයි. එලෙසම, ජයග්‍රාහී ජපමාලයේ ඔබ සියලු දෙනාම දැකිය හැකි වන්නේ එකම දිශාවකට, එකම තැනැත්තා කෙරෙහි සෙනහසින් ස්ථාවරව සිටින විටයි. එවිට ඔබ එම ජපමාලයට අමුණා ගනු ලැබේ. ඔබ අතර දිශා දෙකක් තිබේ නම්, ඔබ අනෙක් ජපමාලයේ, එනම් 16,000ක ජපමාලයේ පබළුවක් බවට පත්වේ.